සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය **ව්‍යවසායකත්ව අධ්‍යයනය - I** කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ව්‍යවසායකයා සම්බන්ධයෙන් වඩාත් නිවැරදි අර්ථකථනය,
 (1) නිෂ්පාදන සාධක ඒකරාශි කරන පුද්ගලයා ව්‍යවසායකයා වේ.
 (2) භාණ්ඩ හා සේවා නිපදවමින් වෙළඳපොළට දිරිපත් කරන පුද්ගලයා ව්‍යවසායකයා වේ.
 (3) පරිසර අවස්ථා ග්‍රහණය කර ගනිමින් නව ව්‍යාපාර ක්‍රියාවලි හා නව ව්‍යාපාර බිහි කරන පුද්ගලයා ව්‍යවසායකයා වේ.
 (4) අවදානම් භාර ගනිමින් ව්‍යාපාර කටයුත්තක නියැලී ලාභ උපරිම කිරීමට කටයුතු කරන පුද්ගලයා ව්‍යවසායකයා වේ.

02. සමනලී සහයිකාවන් දෙදෙනෙකු යොදාගනිමින් මහන යන්ත්‍ර 2 ක් හා රෙදි කැපීමේ යන්ත්‍රයක් ද යොදා ගනිමින් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙහි සඳහන් නිෂ්පාදන සාධක ගණන,
 (1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි.

03. ව්‍යවසායකත්වයේ අරමුණ ලෙස සැලකිය හැක්කේ,
 (1) ඕනෑම අවදානමක් භාර ගැනීමයි (2) තමාට මෙන්ම සමාජයට ද යහපතක් කිරීමයි
 (3) ව්‍යාපාර තුළින් ඉහළ ලාභයක් ඉපයීමයි (4) පරිසර හිතකාමී නිමැවුම් බිහි කිරීමයි

04. වර්තමාන ගෝලීය වසංගත තත්ත්වය හමුවේ වෛද්‍යවරුන්ට දුරසිට රෝගීන් නිරීක්ෂණය සඳහා රොබෝ තාක්ෂණය භාවිතා කිරීම කවර මූලාශ්‍රයක් මත පදනම් වූ නව නිපැයුමක් ලෙස සැලකිය හැකි ද?
 (1) ක්‍රියාවලි අවශ්‍යතා (2) ප්‍රජා පරිසරයේ වෙනස් වීම
 (3) සංජානනය වෙනස් වීම් (4) වෙළඳපොලේ වෙනස්වීම්

05. "ව්‍යවසායකයා ගතික පරිසරය තුළ ඇතිවන වෙනස්වීම් හොඳින් අවබෝධ කර ගනිමින් පාරිසරික වෙනස් වීම් වලට අනුව තම ගමන් මග හැඩගස්වා ගනී." මෙම ව්‍යවසායකත්ව ගුණාංගය වන්නේ,
 (1) නම්‍යශීලීත්වය යි (2) දැක්මක් සහිත බවයි
 (3) ස්වාධීනත්වයයි (4) අවදානම් භාර ගැනීමයි

06. අවශ්‍යතා හා වුවමනා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
 (1) අවශ්‍යතා සංකීර්ණ වන අතර වුවමනා සියලු දෙනාටම පොදු වේ
 (2) වුවමනා පුද්ගලයන්ට අවශ්‍ය වන පරිදි ව්‍යවසායකයන් විසින් නිර්මාණය කිරීම සිදුවේ
 (3) වුවමනා ප්‍රථමයෙන් පැන නගින අතර අවශ්‍යතා ද්විතියික වේ
 (4) එක් වුවමනාවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍යතා රාශියක් යොදා ගත හැකි වේ

07. දියවැඩියාව හා වෙනත් රෝග කිහිපයකට ඖෂධයක් ලෙස භාවිතා කළ හැකි විශේෂ සෞඛ්‍යාරක්ෂිත පාන වර්ගයක් වෙළඳපොළට හඳුන්වා දුන් සුපුන් ඉතා සුළුවෙන් ආරම්භ කළ ව්‍යාපාරය වර්තමානයේ සේවකයන් 100 පමණ රැකියාවේ යෙදෙන, ලෝකයේ රටවල් බොහොමයකට තම නිපැයුම් අපනයනය කරන ව්‍යාපාරයක් බවට පත් වී ඇත. මෙහි හිමිකරු වන සුපුන් හැඳින්විය හැක්කේ,
 (1) සමාජීය ව්‍යවසායකයෙකු ලෙසය (2) හරිත ව්‍යවසායකයෙකු ලෙසය
 (3) අභ්‍යන්තර ව්‍යවසායයෙකු ලෙසය (4) ව්‍යාපාර ව්‍යවසායකයෙකු ලෙසය



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08. ව්‍යාපාර ආරම්භ කිරීමට පදනම් වන මූලික සාධකය ලෙස සැලකිය හැක්කේ,

(1) අවශ්‍යතා හා වුවමනා වේ (2) භාණ්ඩ හා සේවා වේ

(3) ලාභ උපරිම කිරීමේ අරමුණ වේ (4) සමාජ සුභසාධනය වේ

09. ව්‍යාපාරික තීරණයක් අසාර්ථක වීම හෝ සාර්ථක වීම සඳහා පවතින ඉඩකඩ හැඳින්විය හැක්කේ,

(1) දුර්වලතාවයක් ලෙසය (2) තර්ජනයක් ලෙසය

(3) අවදානමක් ලෙසය (4) අභියෝගයක් ලෙසය

10. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමාන කමකි,

(1) තරඟය කැමැත්තෙන් සොයා යාම (2) ආර්ථික කටයුත්තක යෙදීම

(3) ආසන්න ඉලක්ක ඇතිකර ගැනීම (4) අවදානම් භාර නොගැනීම

11. පහත ව්‍යාපාර අතරින් ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක් වන්නේ,

(1) පෞද්ගලික පාසල් (2) ග්‍රාමීය සංවර්ධන බැංකු

(3) සුපිරි වෙළඳ සැල් (4) රජයේ රෝහල්

12. ව්‍යාපාරය සමස්තයක් ලෙස සලකා බලමින් අනාගතයේ දී ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම

(1) තාක්ෂණික කුසලතා වේ (2) මානව කුසලතා වේ

(3) සංකල්පනාත්මක කුසලතා වේ (4) සන්නිවේදන කුසලතා වේ

13. නිමල්ගේ ව්‍යාපාරය පිළිබඳ පහත ප්‍රකාශ ඔබට ලබා දී ඇත

A - සේවකයන් සේවයට වාර්තා කිරීම අවිධිමත් ය

B - විශාල ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් සිටී

C - ගුණාත්මක භාණ්ඩ සාධාරණ මිලට සැපයීමට හැකි වී ඇත

D - රජයෙන් බදු සහනයක් ලැබී ඇත

නිමල්ගේ ව්‍යාපාරයේ ශක්තියක් හා දුර්වලතාවයක් වන්නේ,

(1) B හා C (2) B හා D (3) A හා C (4) C හා D

14. ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන නිෂ්පාදන අංශ වනුයේ,

(1) සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ, මහා පරිමාණ අංශයන් ය.

(2) රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශයන් ය.

(3) දේශීය හා විදේශිය අංශයන් ය.

(4) ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අංශයන් ය.

15. ශ්‍රී ලංකාවේ සුලභ සම්පත් ප්‍රධාන කොටස් දෙකකි. ඒවා නම්,

(1) ස්වාභාවික හා මානව සම්පත් (2) භෞතික හා මානව සම්පත්

(3) මානව හා මානව නොවන සම්පත් (4) භෞතික හා ස්වභාවික සම්පත්

16. නිෂ්පාදිත ප්‍රභේදනය යන්නෙන් අදහස් වන්නේ,

(1) ඉල්ලුමට අනුව භාණ්ඩයේ මිල වෙනස් කිරීම

(2) විශාල භාණ්ඩ තොගයක් වෙළඳපොළට ඉදිරිපත් කිරීම

(3) තම නිෂ්පාදිත තරඟකරුවන්ගේ නිෂ්පාදිත වලින් වෙන්කර හඳුනා ගැනීමට උපක්‍රම යෙදීම

(4) තරඟකරුවන්ගේ නිෂ්පාදන හා අලෙවි උපක්‍රම තම ව්‍යාපාරය තුළ ද භාවිතා කිරීම

17. පහත වැකි අතරින් නිවැරදි වැකිය තෝරන්න.

(1) ඕනෑම ව්‍යාපාර අදහසක් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි ය

(2) පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුලින් ව්‍යාපාර අදහස් මතු කර ගත නොහැකි ය

(3) ව්‍යාපාර අදහස් සුලභ නොවන අතර ක්‍රියාත්මක කිරීම පහසුය

(4) ව්‍යාපාර අදහස් සිය ගණනක් අතරින් හොඳ ව්‍යාපාර අවස්ථාවක් තෝරාගත යුතුය

18. ව්‍යාපාර ආයතනයක ආර්ථික වගකීම වන්නේ,

(1) ඒකාධිකාරයක් ගොඩනගා ගැනීම (2) සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම

(3) ශ්‍රමයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම (4) තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීම

19. ව්‍යාවසායකයන් විසින් නිර්මාණය කර සම්පූර්ණ කරන්නේ,

(1) මිනිසුන්ගේ අපේක්ෂාවන් ය (2) මිනිසුන්ගේ වුවමනාවන් ය
(3) මිනිසුන්ගේ අවශ්‍යතාවන් ය (4) මිනිසුන්ගේ අරමුණු ය

20. ව්‍යාපාර අදහස පැහැදිලි කිරීමට, ව්‍යාපාරය සඳහා මග පෙන්වීමට, ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්වාදීමට,

(1) ව්‍යාපාරයට ව්‍යාපාර සැලැස්මක් අවශ්‍ය වේ (2) ව්‍යාපාරයට සංවිධාන ව්‍යුහයක් අවශ්‍ය වේ
(3) ව්‍යාපාරයට අරමුණු හා පරමාර්ථ අවශ්‍ය වේ (4) ව්‍යාපාරයට තරඟකාරී ව්‍යාපාර අවශ්‍ය වේ

21. "ශදුඅත" විශ්ලේෂණය යටතේ සිදු කෙරෙන්නේ, සූක්ෂම විශ්ලේෂණය යටතේ තෝරා ගත් ව්‍යාපාර අදහස් එකිනෙක වෙනම හඳුනාගෙන,

(1) යෝග්‍ය ම හොඳම ව්‍යාපාර අදහස තෝරා ගැනීමයි
(2) ව්‍යාපාරික අවස්ථාවට වාසි දායක සාධක සොයා බැලීමයි
(3) ව්‍යාපාර අවස්ථාවට අවාසි දායක සාධක සොයා බැලීමයි
(4) ඉහත සියලු කරුණු සලකා බැලීමයි

22. ව්‍යාපාර ආයතනයේ සුවිශේෂත්වය දක්වෙන, ව්‍යාපාර සැලැස්මේ මූලිකාංගය වන්නේ,

(1) විධායක සාරාංශයයි (2) මූල්‍ය සැලැස්මයි
(3) අලෙවි සැලැස්මයි (4) නිෂ්පාදන සැලැස්මයි

- **පහත දක්වෙන්නේ ප්‍රසන්න ගේ ව්‍යාපාරයේ මාසික විකුණුම් පුරෝකථනයයි.**

| භාණ්ඩය | මාසික අපේක්ෂිත විකුණුම් ඒකක | ඒකක මිල රු. |
|---|---|---|
| A | 2 000 | 20 |
| B | 3 000 | 10 |

23. ප්‍රසන්නගේ ව්‍යාපාරයේ අපේක්ෂිත මාසික විකුණුම් ඒකක ප්‍රමාණය වන්නේ,

(1) 4 000 (2) 5 000 (3) 6 000 (4) 7 000

24. ප්‍රසන්නගේ ව්‍යාපාරයේ අපේක්ෂිත මාසික විකුණුම් වටිනාකම වන්නේ,

(1) රු. 40 000 (2) රු. 43 000 (3) රු. 70 000 (4) රු. 60 000

25. ව්‍යාපාරිකයෙකු තම නිෂ්පාදිත පාරිභෝගිකයා වෙත ලඟා කර දීමට උචිත උපාය මාර්ග සලකා බැලීම අයත් වන අලෙවි මිශ්‍රයේ විචල්‍යය වන්නේ,

(1) මිල (2) නිෂ්පාදිතය (3) ස්ථානය (4) ප්‍රවර්ධනය

26. පහත දක්වෙන්නේ සපත්තු නිෂ්පාදන ව්‍යාපාරයක පිරිවැය පිළිබඳ තොරතුරු කිහිපයක් හා එම තොරතුරු අදාල වන පිරිවැය වර්ග වේ.

| A | B |
|---|---|
| 01. ද්‍රව්‍ය පිරිවැය | a. කර්මාන්ත ශාලාවේ විදුලි වියදම |
| 02. ශ්‍රම පිරිවැය | b. සම් සඳහා වැය වන මුදල |
| 03. නිෂ්පාදනයට වැය වන වෙනත් පිරිවැය | c. සපත්තු නිෂ්පාදන සේවක වැටුප් |

A හා B නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) 1 - a, 2 - c, 3 - b (2) 1 - c, 2 - b, 3 - a
(3) 1 - b, 2 - a, 3 - c (4) 1 - b, 2 - c, 3 - a

27. නිෂ්පාදන ස්ථාවර වත්කමකි.

(1) අමුද්‍රව්‍ය (2) නිෂ්පාදන සේවකයන් (3) යන්ත්‍ර (4) ප්‍රදර්ශනාගාරය

28. සුනිමල් උසස් පෙළ විභාගය සමත් වීමෙන් පසු විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධන උපාධිය සමත්ව ඇත. ඇඟලුම් කර්මාන්ත ශාලාවක එක්තරා තනතුරක් සම්බන්ධයෙන් ඔහු විසින් අයදුම්පතක් ඉදිරිපත් කර ඇත. එම තනතුර විය හැක්කේ,

(1) නිෂ්පාදන කළමනාකරු (2) මූල්‍ය කළමනාකරු
(3) අලෙවි කළමනාකරු (4) මානව සම්පත් කළමනාකරු

29. අපේක්ෂිත ව්‍යාපාර කටයුත්ත සම්බන්ධව අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීම, ඒවා විශ්ලේෂණය හා වාර්තා සකසා ගැනීම හැඳින්විය හැක්කේ,

(1) සැලසුම්කරණය ලෙසය (2) වෙළඳපොල සමීක්ෂණය ලෙසය
(3) ස්ථානය සංවර්ධනය ලෙසය (4) සංවිධානකරණය ලෙසය

- පහත දැක්වෙන්නේ සහන්ගේ ව්‍යාපාරයේ 2019 වර්ෂය සඳහා අදාල වන තොරතුරු වේ.

| | |
|---|---|
| විකුණුම් ආදායම | 5 000, 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 2 000, 000 |
| ශ්‍රම පිරිවැය | 5 00, 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 5 00, 000 |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 3 00, 000 |
| පරිපාලන වියදම් | 1 00, 000 |
| මූල්‍ය වියදම් | 5 0, 000 |

30. සහන්ගේ ව්‍යාපාරයේ මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ,
    (1) 2 000, 000 (2) 3 000, 000 (3) 3, 450, 000 (4) 3 500, 000

31. සහන්ගේ ව්‍යාපාරයේ මුළු නිෂ්පාදන නොවන පිරිවැය වන්නේ,
    (1) 450, 000 (2) 500, 000 (3) 950, 000 (4) 4 500, 000

32. සහන්ගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,
    (1) 900,00 (2) 950, 000 (3) 1 550, 000 (4) 1, 950, 000

33. ව්‍යාපාර සංවිධාන පිළිබඳ ප්‍රකාශයන් 02 ක් පහත දැක්වේ.

    A - පොදු අරමුණක් පැවතීම ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දැකිය හැකි ලක්ෂණයකි.

    B - ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර සහ ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකෙහිම ක්‍රියාත්මක වේ.

    ඉහත ප්‍රකාශ අතරින්,
    (1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ
    (3) A හා B අසත්‍ය වේ (4) A හා B සත්‍ය වේ

34. හවුල් ව්‍යාපාර වල දැකිය නොහැකි ලක්ෂණයකි.
    (1) නෛතික පුද්ගලභාවක් නොමැති වීම (2) ලියා පදිංචිය අනිවාර්‍ය්‍ය නොවීම
    (3) අඛණ්ඩ පැවැත්මක් තිබීම (4) වගකීම අසීමිත වීම

35. මුළු ආයෝජන ඇස්තමේන්තුවේ ඇතුළත් වන ප්‍රධාන ආයෝජන කාණ්ඩයකි.
    (1) බැංකු ණය (2) ස්ථාවර වත්කම්
    (3) ලියාපදිංචි ගාස්තු (4) ව්‍යාපාර සැලසුම් සැකසීම

36. සංස්ථාපිත සමාගමක පමණක් දැකිය හැකි ලක්ෂණයකි.
    (1) අඛණ්ඩ පැවත්මක් හිමිවීම (2) වගකීම සීමා සහිත වීම
    (3) කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය රැස් කිරීම (4) නෛතික පුද්ගලභාවය හිමි විම

37. වරලත් ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
    (1) විශාල සේවක මණ්ඩලයක් අවශ්‍ය වීම (2) පාර්ශව දෙකක් සම්බන්ධ වීම
    (3) වරලත් ගිවිසුම මත ක්‍රියාත්මක වීම (4) වරලත් හිමියාගේ කීර්තිනාමය භාවිතා කිරීම

38. ව්‍යවසායකත්වයට එරෙහි සමාජයීය සාධකයකි,
    (1) නීතිමය බලපෑම් අධික වීම (2) පොලී අනුපාත ඉහළ යාම
    (3) ආනයන ඉහළ යාම (4) යැපුම් මානසිකත්වයෙන් යුක්ත වීම

39. ව්‍යාපාරිකයෙකුට භාණ්ඩයේ හෝ සේවාවේ ගුණත්වය වර්ධනය කිරීම සම්බන්ධයෙන් වූ වගකීම,
    (1) ආර්ථික වගකීමකි (2) නීතිමය වගකීමකි
    (3) සදාචාරාත්මක වගකීමකි (4) පරාර්ථකාමී වගකීමකි

40. අපනයන භාණ්ඩ වල තත්වය පරීක්ෂා කරන ආයතන වන්නේ,
    (1) කාර්මික සංවර්ධන මණ්ඩලය (2) කාර්මික තාක්ෂණ ආයතනය
    (3) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (4) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **ව්‍යවසායකත්ව අධ්‍යයනය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයː |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) විපුල මහතා සැම විටම වෙනස් වීම් වලට කැමති නව ආකාරයට සිතන නවතම දේ බිහි කිරීමට උත්සුක වන පුද්ගලයෙකි. නිරන්තරයෙන් ස්වාධීනව කටයුතු කරන ඔහු තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම පිළිබඳ නිතර සුභවාදී සිහින දකිමින් සිටි අයෙකි. ඔහු තුළ පහළ වූ ව්‍යාපාර අදහස් අතරින්, ව්‍යාපාර අදහස් ඇගයීමට භාජනය කර යෝග්‍යතම ව්‍යාපාර අවස්ථාව තෝරා ගන්නා ලදී. තරඟකාරිත්වයට මුහුණ දීමට විපුල මහතා ඉතා කැමති වූ අතර ඔහු අත මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට ප්‍රමාණවත් මුදලක් නොතිබිණි. ඔහුට සහනදායි පොලී අනුපාත යටතේ ණය මුදලක් ලබා ගැනීමට හැකියාවක් ඇති අතර රජයේ විවිධ දිරිගැන්වීම් පිළිබඳවත්, සම්පත් පැවතීම පිළිබඳවත් අවබෝධයක් ලබා ගෙන තිබුණි. ඒ අනුව විපුල මහතා බෙලි යොදාගෙන යෝගට් නිෂ්පාදනය කිරීමට සහ අලෙවි කිරීමට අදහස් කරන ලදී.

"පෝෂ්‍යදායි බෙලි යෝගට්" නමින් ව්‍යාපාරය තමා තනිවම මුදල් යොදා ආරම්භ කිරීමට තීරණය කර ඇත. විපුල මහතා ආරම්භ කිරීමට නියමිත ව්‍යාපාරයේ පළමු වර්ෂයේ දැරීමට අපේක්ෂිත වියදම් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| යෝගට් සැකසීමේ යන්ත්‍රය | 200,000 |
| අනෙකුත් උපකරණ | 60,000 |
| ලී බඩු | 20,000 |
| ව්‍යාපාර සැලැස්ම සැකසීම | 10,000 |
| වෙළඳපළ සමීක්ෂණ වියදම් | 15,000 |
| ලියාපදිංචි ගාස්තු | 2,000 |
| දෛනික වැටුප් | 10,000 |
| වෙනත් දෛනික වියදම් | 27,000 |

ඉහත සඳහන් විපුල මහතාගේ සිද්ධිය ඇසුරින් i - x දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. විපුල මහතා සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
ii. විපුල මහතාගේ නිෂ්පාදිතයේ නම කුමක් ද?
iii. මෙම ව්‍යාපාරයට පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජනය බැගින් ලියන්න.
iv. නව ව්‍යවසායකයෙකු ලෙස විපුල මහතා වෙළඳපළට ප්‍රවේශ වීමට නියමිත විකල්ප ක්‍රමය සඳහන් කරන්න.
v. විපුල ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන වර්ගයේ ව්‍යාපාරයක් ද?
vi. එම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුත්තේ කිනම් ආයතනයක කිනම් පනතක් යටතේ ද?
vii. විපුල ව්‍යාපාරයට යෙදවීමට අපේක්ෂා කරන ස්ථාවර වත්කම් වල වටිනාකම ගණනය කරන්න.
viii. මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර විපුලට දැරීමට සිදුවන වියදම් ගණනය කරන්න.
ix. විපුලගේ ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධනය ගණනය කරන්න.
x. විපුලගේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන මුළු ආයෝජන ගණනය කරන්න.

(ලකුණු 02 × 10 = 20)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(02) i. ව්‍යවසායකත්ව සංකල්පය ව්‍යාපාරික දෘෂ්ඨිකෝණයෙන් පැහැදිලි කරන්න.
ii. නිෂ්පාදන සාධක නම් කර ඉන් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක **හතරක්** ලියන්න.
iv. නවෝත්පාදනය සිදුවන ආකාර **දෙකක්** හා ඒ සඳහා උදාහරණය බැගින් ලියන්න.
v. අවදානම සහ ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.
(ලකුණු 02 × 05 = 10)

(03) i. ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ **හතරක්** ලියන්න.
ii. කුඩා පරිමාණ ව්‍යාපාර හා ව්‍යවසායකත්වය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.
iii. කුඩා පරිමාණ ව්‍යාපාර වල සීමා **හතරක්** සඳහන් කරන්න.
iv. බොහෝ කුඩා පරිමාණ ව්‍යාපාර විවිධ හේතූන් මත අසාර්ථක වී තිබේ. එසේ කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක නොවී සාර්ථකව පවත්වාගෙන යාමට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** ලියන්න.
v. ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමේ දී ඔවුන් විවිධ භූමිකාවල නියැලේ. එම භූමිකා මොනවදැයි නම් කර ඉන් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 02 × 05 = 10)

(04) i. ව්‍යාපාර පරිසරය තුළ ඇති සැබෑ වෙනස්කම් අවබෝධ කර ගැනීම තුළින් ව්‍යවසායකයාට ලබාගත හැකි ප්‍රයෝජන **හතරක්** ලියන්න.
ii. ව්‍යවසායකයෙකුට ගෝලීය පරිසරය විශ්ලේෂණය කිරීමෙන් ලබා ගත හැකි තොරතුරු හතරක් සඳහන් කරන්න.
iii. පරිසර ප්‍රවණතා පිළිබඳව සංවේදී වීමෙන් ලඟා කර ගත හැකි ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න.
iv. නව ව්‍යවසායකයෙකුට වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා අනුගමනය කළ හැකි විකල්ප ක්‍රම මොනවාද?
v. වෙළඳපල හිඩැස යන සංකල්පය, කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 × 05 = 10)

(05) i. හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
ii. ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර වෙනස්කම් **දෙකක්** ලියන්න
iii. යෝග්‍ය ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේ ක්‍රියාවලියෙහි පියවර පිළිවෙලින් ලියා දක්වන්න.
iv. විධායක සාරාංශයක ඇතුළත් වන කරුණු **හතරක්** ලියන්න.
v. ව්‍යාපාර සැලැස්මක් පැවතීමෙන් ව්‍යවසායකයෙකුට ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** ලියන්න.
(ලකුණු 02 × 05 = 10)

(06) i. (අ) සී/ස පෞද්ගලික සමාගමක් ආරම්භ කිරීමේ දී ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි මොනවාද?
(ආ) එම ලියාපදිංචිය සිදු කරනු ලබන ආයතනය කුමක් ද?
ii. ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය වීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න.
iii. කාන්තාවන්හට ව්‍යාපාරික කටයුතු වල නිරත වීම සඳහා ශ්‍රී ලංකා අර්ථිකයේ පවතින අවස්ථා **හතරක්** ලියන්න.
iv. ව්‍යාපාර සමාජ වගකීම් මට්ටම් **හතර** ලියන්න.
v. ව්‍යාපාරයක් ආරම්භ කරන්නන් හට රජයේ දිරිගැන්වීම් අවශ්‍ය වීමට හේතු **දෙකක්** දක්වන්න.
(ලකුණු 2 × 5 = 10)

07. i. අලෙවි සැලැස්මක හා නිෂ්පාදන සැලැස්මක ඇතුළත් තොරතුරු දෙක බැගින් සඳහන් කරන්න.
ii. දුව පුටුවක් නිපදවීම සම්බන්ධ යෙදවුම්, නිමවුම් ක්‍රියාවලිය ඇඳ දක්වන්න.
iii. පහත සඳහන් තනතුරු වලට අදාල කාර්යයන් එක බැගින් ලියන්න.
● සුපරීක්ෂක ● මූල්‍ය කළමනාකරු ● ගණකාධිකාරී ● අයිතිකරු / ප්‍රධානියා
iv. විමුක්ති තම අධ්‍යාපන කටයුතු අවසන් කර අත්බෑග් නිෂ්පාදනය කර බෙදා හැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. එහි අපේක්ෂිත තොරතුරු පහත පරිදි වේ.

| | රුපියල් |
|---|---|
| රෙදි | 15 000 |
| නූල් | 5 000 |
| බොත්තම් | 2 500 |
| අනෙකුත් අමුද්‍රව්‍ය | 500 |
| ශ්‍රමිකයා සඳහා | 1 200 |
| වෙනත් වියදම් | 800 |

මුල් මාසයේ දී අත්බෑග් පනහක් (50) නිපදවීමට අපේක්ෂා කරයි.
අවශ්‍ය වන්නේ,
(අ) මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම
(ආ) ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(3) | 3 -(2) | 4 -(4) | 5 -(1) | 6 -(2) | 7 -(4) | 8 -(1) | 9 -(3) | 10 -(2) |
| 11-(4) | 12 -(3) | 13 -(3) | 14 -(4) | 15 -(3) | 16 -(3) | 17 -(4) | 18 -(2) | 19 -(3) | 20 -(1) |
| 21-(1) | 22 -(1) | 23 -(2) | 24 -(3) | 25 -(4) | 26 -(4) | 27 -(3) | 28 -(1) | 29 -(2) | 30 -(2) |
| 31-(1) | 32 -(3) | 33 -(4) | 34 -(3) | 35 -(2) | 36 -(3) | 37 -(1) | 38 -(4) | 39 -(3) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. • නවෝත්පාදනය, නිර්මාණශීලීත්වය, අවස්ථා හඳුනාගැනීම, සුභවාදී බව (ල. 02)

ii. • පෝෂ්‍යදායී බෙලි යෝගට් (ල. 02)

iii.

| | |
|---|---|
| • ශක්තිය | දැනුම පැවතීම |
| • දුර්වලතා | මූල්‍යයමය වශයෙන් ශක්තිමත් බව අඩු වීම |
| • අවස්ථා | විවිධ වෙළෙඳපල කණ්ඩායම් ඉලක්ක කර යෝගට් නිපදවීමට ඇති ඉඩකඩ, රජයේ දිරි දීමනා |
| • තර්ජන | තරඟකරුවන් වෙළෙඳපලට පැමිණීම |

(ගැලපෙන පිළිතුරකට ලකුණු ලබා දෙන්න) (ල. 1/2 බැගින් කරුණු 04 = ල. 02)

iv. • නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපොලට (ල. 02)

v. • තනි පුද්ගල / කේවල ස්වාමි ව්‍යාපාර (ල. 02)

vi. ★ අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ (ල. 01)

★ 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත අනුව (ල. 01)

vii.

| ස්ථාවර වත්කම් | රු. | | |
|---|---|---|---|
| යෝගට් නිෂ්පාදන යන්ත්‍රය | 200 000 | (ල. 1/2) | (ල. 02 හෝ) |
| අනෙකුත් උපකරණ | 60 000 | (ල. 1/2) | |
| ලීබඩු | 20 000 | (ල. 1/2) | |
| | 280 000 | (ල. 1/2) | |

(පිළිතුරු රු. 280 000/= පමණක් ඇත්නම් ල. 2 යි)

viii.

| ආරම්භ කිරීමට පෙර දරන වියදම | රු. | | |
|---|---|---|---|
| ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම | 10 000 | (ල. 1/2) | (ල. 02 හෝ නිවැරදි පිළිතුරු ඇත්නම් ල. 02 යි) |
| වෙළඳපල සමීක්ෂණ | 15 000 | (ල. 1/2) | |
| ලියාපදිංචි ගාස්තු | 2 000 | (ල. 1/2) | |
| | 27 000 | (ල. 1/2) | |

ix.

| කාරක ප්‍රාග්ධනය | රු. | | |
|---|---|---|---|
| දෛනික වැටුප් | 10 000 | (ල. 1/2) | (ල. 02 යි) |
| වෙනත් දෛනික වියදම් | 27 000 | (ල. 1/2) | |
| | 37 000 | (ල. 1/2) | |

(නිවැරදි පිළිතුර රු. 37 000/= පමණක් ඇත්නම් ල. 02 යි අයිතම පමණක් ඇත්නම් එක් අයිතමයකට ල. 1/2 බැගින්)

x.

| මුළු ආයෝජනය | රු. | | |
|---|---|---|---|
| ස්ථාවර වත්කම් | 280 000 | (ල. 1/2) | (ල. 02) |
| ආරම්භ කිරීමට පෙර වියදම් | 27 000 | (ල. 1/2) | |
| කාරක ප්‍රාග්ධන අවශ්‍යතා | 37 000 | (ල. 1/2) | |
| | 344 000 | (ල. 1/2) | |

(නිවැරදි පිළිතුර රු. 344 000/= පමණක් ඇත්නම් ල. 02 යි අයිතම පමණක් ඇත්නම් එක් අයිතමයකට ල. 1/2 බැගින්)

(02) i. ව්‍යාපාර අදහසක් හඳුනාගෙන එය ප්‍රායෝගික ව්‍යාපාර කටයුත්තක් බවට පරිවර්ථනය කිරීමේ හැකියාව ව්‍යවසායකත්වය වේ. මෙහිදී නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය සහ අවදානම් භාර ගැනීම යන ලක්‍ෂණ ඉතා වැදගත් වේ. (මෙම අදහස ඇත්නම් ල. 02)

ii. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය (නම් කිරීම් දෙකකට ල. 1/2 බැගින් ල. 01 යි. පැහැදිලි කිරීම් එකකට 1/2 බැගින් දෙකටම ල. 01 යි)

iii.
- විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
- යම් ගැටලුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම
- ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
- තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම
- ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම
- රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළිපැදීම
- වැරදි හා විවේචන සඳහා ඇති බිය

(ඕනෑම කරුණු 04 කට එක් කරුණකට ල. 1/2 බැගින් ල. 02)

iv.
i. නව සොයා ගැනීමක් - ඕනෑම ගැළපෙන උදාහරණයක්
ii. දිගුවක්
iii. අනුකරණයක්
iv. සංකලනයක් (උදාහරණ 02 ක් වත් සහිතව කරුණු 02 ක් ඇත්නම් එක් කරුණකට ල. 01 බැගින් ල. 02 යි) උදාහරණ රහිතව කරුණු පමණක් ඇත්නම් එක් කරුණකට ල. 1/2 බැගින් ල. 01 යි)

v. අවදානම හා ප්‍රතිලාභය අතර ඇත්තේ අනුලෝම සම්බන්ධතාවයකි. අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ද ඉහළ වේ. අවදානම පහළ නම් ප්‍රතිලාභය ද පහළ වේ.
(මෙම අදහස ඇත්නම් ල. 02 යි)

(03) i.
- දේශීය සම්පත් උපයෝජනය කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනය සිදුවීම
- නව භාණ්ඩ හා සේවා වෙළඳපොලට ඉදිරිපත් කිරීම
- රැකියා අවස්ථා ජනනය කිරීම
- නිමැවුම් අපනයනය කිරීම මගින් විදේශ විනිමය ඉපයීමේ හැකියාව
- රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම
- ආදායම් බෙදීයාමේ විෂමතා අඩු වීම
- ආර්ථික සංවර්ධනයට දායක වීම
- ස්වෛරී හා නිවහල් ආර්ථිකයක් හා සමාජයක් නිර්මාණය වීම

(ඕනෑම කරුණු 04 කට කරුණකට ල. 1/2 බැගින් ල. 02 යි)

ii.
- බොහෝ සාර්ථක මහා පරිමාණ ව්‍යාපාරවල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාර වේ.
- කුඩා ව්‍යාපාර තුළින් ව්‍යවසායකයන්ට නිර්මාණශීලී කුසලතා ප්‍රායෝගිකව පහසුවෙන් භාවිත කරමින් නවෝත්පාදන බිහි කළ හැකි වීම
- වෙළඳපොළ හිදැස හඳුනාගෙන ව්‍යාපාර අවස්ථා වලට පිවිසිය හැකි වීම

(මින් කරුණු 02 ක් පැහැදිලි වේ නම් ල. 02 යි)

iii.
- ව්‍යාපාරවලට අවශ්‍ය ප්‍රාග්ධනය රැස්කර ගන්නා මාර්ග සීමා වීම
- නවීන තාක්‍ෂණය භාවිත නොවීම
- වෙළෙඳපළ සීමා වීම
- ව්‍යාපාරික කටයුතු වලට පවුලේ සාමාජිකයන්ගේ මැදිහත් වීම වැඩි වීම
- ව්‍යාපාර හිමිකරුවන්ගේ පළපුරුද්ද හා දැනුම සීමාකාරී වීම

(ඕනෑම කරුණු 04 කට, එක් කරුණකට ල. 1/2 බැගින් ල. 02 යි)

iv.
- ව්‍යාපාරික කටයුතු සඳහා නිවැරදි සැලසුම් සකස් කිරීම හා ඒවාට අනුව ක්‍රියා කිරීම
- ප්‍රවීනයන්ගෙන් අවශ්‍යය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා ගැනීම
- ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීම
- බාහිර පරිසරයේ ඇතිවන වෙනස්කම් හඳුනාගැනීම හා අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම
- ව්‍යාපාරිකයාගේ පෞද්ගලික ජීවිතය ව්‍යාපාර කටයුතු වලින් වෙන් කොට තැබීම
- වෙළඳපල පහසුකම්, ණය පහසුකම්, පර්යේෂණ කටයුතු ආදී කාර්යය සඳහා උදව්වන රාජ්‍ය ආයතනවල සහාය ලබා ගැනීම
- යහපත් මානව සම්බන්ධතා පවත්වා ගැනීම

(මෙම කරුණු අදහස් වන ඕනෑම කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 ට ල. 02 යි)

v.
- අයිතිකරුගේ භූමිකාව
- කලමණාකරුගේ භූමිකාව
- නායකයාගේ භූමිකාව

(භූමිකා තුනම නම් කර ඇත්නම් ල. 01 යි. නැත්නම් 1/2 ඉන් භූමිකා දෙකක් නිවැරදිව පැහැදිලි කර ඇත්නම් එකකට 1/2 බැගින් ල. 01 යි)

04. i.
- ව්‍යාපාරය සතු ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීම
- පරිසරයේ තිබෙන විවිධ ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම
- ව්‍යාපාර මුහුණ දෙන තර්ජන හඳුනා ගැනීම
- පරිසර වෙනස් වීම් වලට ගැළපෙන පරිදි නිෂ්පාදන හා අලෙවි කටයුතු පවත්වාගෙන යාම
- පරිසර වෙනස්වීම් වලට අනුව සැළසුම් සකස් කිරීම සහ උපාය මාර්ග තීරණය කිරීම

(එක් කරුණකට ල. 1/2 බැගින් ල. 02 යි)

ii.
- අන්තර්ජාතික වෙළඳපලට පිවිසීම ඇති අවස්ථා පිළිබඳව
- අන්තර්ජාතික වෙළඳපල ග්‍රහණය කිරීමට තම ව්‍යාපාරයට ඇති ශක්තීන් ප්‍රමාණවත් ද යන්න පිළිබඳව
- විවිධ රටවල නිෂ්පාදිත දේශිය නිෂ්පාදිත වලට ඇති කරන තර්ජන පිළිබඳව
- ගෝලීය වෙළඳපළ ප්‍රවණතා පිළිබඳව

(කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 ට ල. 02 යි)

iii.
- නව ආදායම් මාර්ග සකස් කර ගැනීමේ හැකියාව වැඩි කර ගැනීම සඳහා
- වෙළඳපළ තුළ තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා
- පරිසරය තුළ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සම්පත් ප්‍රයෝජනයට ගැනීමට
- සාර්ථක ව්‍යාපාර අවස්ථා ග්‍රහණය කර ගැනීම සඳහා
- පරිසර ගැටළු අවම කිරීමට
- අර්ථක්‍රමය තුළ අවශ්‍යයෙන්ම ඉටු කළ යුතු සංවර්ධන ක්‍රියාදාමයන් මතුකර ගැනීමට
- තිරසර සංවර්ධනයට

(ඕනෑම කරුණු 04 කට ල. 02 යි. එක් කරුණකට ල. 1/2 බැගින්)

iv.
- පවතින භාණ්ඩයක් හෝ සේවයක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීම
- පවතින භාණ්ඩයක් හෝ සේවයක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීම
- නව භාණ්ඩ හෝ සේවාවක පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීම
- නව භාණ්ඩ හෝ සේවා නව වෙළඳපලට ඉදිරිපත් කිරීම

(එක් කරුණකට ල. 1/2 බැගින් ල. 02 යි)

v.
- වෙළඳපල හිඩැස යනු වෙළඳපලෙහි පාරිභෝගිකයන් කොටසක් තෘප්තිමත් නොවූ අවශ්‍යතා හා වුවමනා සහිතව පසු වීමයි.

(අදහස පැහැදිලි වන පිළිතුරක් ඇත්නම් ල. 02 යි)

(මුළු ල. 10)

(05) i.
- ⋆ අවශ්‍ය සම්පත් සපයා ගත හැකි වීම
- ⋆ ආකර්ශනීය ඉපැයුමක් තිබීම
- ⋆ නීති රීති වලට අනුකූල වීම
- ⋆ ඉල්ලුමක් පැවතීම
- ⋆ තරගකාරීත්වයට මුහුණ දිය හැකි වීම
- ⋆ අවශ්‍ය සම්පත් සපයා ගත හැකි වීම

(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 කට ල. 02 යි)

ii.

| ව්‍යාපාර අදහස් | ව්‍යාපාර අවස්ථා |
|---|---|
| • සුලභය, විවිධ මූලාශ්‍ර ඔස්සේ විශාල ප්‍රමාණයක් ඇති විය හැකිය. | • සුලභ නොවේ. අදහස් සිය ගණනකින් තෝරාගත හැක්කේ අවස්ථා කිහිපයකි. |
| • අදහස් විවෘතය, බොහෝ අය දකිති. | • ව්‍යාපාර අදහස් අතරින් ව්‍යාපාර අවස්ථා මතුකර ගැනීම සිදුවේ. |
| • සෑම අදහසක්ම ක්‍රියාවට නැංවිය නොහැක. | • ව්‍යාපාර අවස්ථාව ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවිය හැකිය. |

(වෙනස්කම් 01 කට 01 බැගින් වෙනස්කම් දෙකට ල. 02 යි)

iii. • සාර්ව විශ්ලේෂණය • සූක්ෂම විශ්ලේෂණය • ශඳු අත විශ්ලේෂණය

(පියවර තුනම නම්කර ඇත්නම් ල. 02 යි. දෙකක් නම් ල. 01 යි එකක් නම් ල. 1/2)

iv.
- ව්‍යාපාරයේ නම, කර්මාන්ත ක්ෂේත්‍රය, කුමක් ද යන්න ඉතා කොටියෙන්
- අලෙවි සැලැස්මේ ඉතා වැදගත් කරුණු සාරාංශගතව
- නිෂ්පාදන සැලැස්මෙහි ඉතාම වැදගත් කරුණු සාරාංශගතව
- පරිපාලන සැලැස්මේ ඉතා වැදගත් කරුණු සාරාංශගතව
- මූල්‍ය සැලැස්මේ ඉතා වැදගත් කරුණු සාරාංශගතව
- ව්‍යාපාරයේ සුවිශේෂිතාවය ඉතා කෙටියෙන්
- ව්‍යාපාර සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමේ පරමාර්ථ හා අරමුණු කෙටියෙන්

(කරුණු එකකට 1/2 බැගින් කරුණු 04 ට ල. 02 යි)

v.
- ව්‍යාපාර අදහස පැහැදිලි කර ගැනීමට හැකි වීම
- ව්‍යාපාරය සඳහා මග පෙන්වීමක් වීම
- ව්‍යාපාර පරිසරය පිළිබඳව අවබෝධ කර ගැනීමට
- ව්‍යාපාරයේ අනාගත දිශාව පෙන්වා දීමට
- අරමුදල් සම්පාදනය කර ගැනීමට
- වෙළඳපල පිළිබඳ හොඳ තක්සේරුවක් ලබා ගැනීමට
- ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමට
- ව්‍යාපාරයේ සාර්ථකත්වය දැන ගැනීමට
- ව්‍යාපාරය පිළිබඳ සමස්ථ අවබෝධයක් ලබා ගැනීමට

 (කරුණු එකකට 1/2 බැගින් කරුණු 04 ට ල. 02 යි)

06. i. (අ) ● සමාගමේ නම පිළිබඳ ප්‍රකාශය ● සාංගමික ව්‍යවස්ථාවලිය
● සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීමට ඒ ඒ අධ්‍යක්ෂකවරයාගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශය
● සමාගමේ ලේකම්වරයා ලෙස කටුයතු කිරීමට එම ලේකම්වරයාගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශය
(කරුණු සියල්ලම ඇත්නම් ල. 03 යි. කරුණු 03 යි. නම් ල. 02 යි. කරුණු දෙකක් නම් ල. 01 යි. එක් කරුණක් නම් ල. 1/2යි)

(ආ) සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව (ල. 01 යි)

ii. ● විරැකියාවට විසඳුමක් වීම ● ආර්ථික වර්ධනයක් ළඟාකරගත යුතු වීම
● භාවිත නොවන සම්පත් සුලභව තිබීම ● නව රැකියා නිර්මාණය කරන්නන් බිහිකරගත යුතු වීම
● ආදායම් බෙදීයාමේ විෂමතාවය අවම කලයුතු වීම
(කරුණු දෙකක් පැහැදිලි කර ඇත්නම් ල. 02 යි)

iii. ● සේවා සඳහා ඉහළ ඉල්ලුමක් නිර්මාණය වි තිබීම
● කාන්තාව කෙරෙහි පැවති සමාජ ආකල්ප වෙනස්වෙමින් පැවතීම
● කාන්තාවන් සඳහා ම විශේෂිත වූ මූල්‍ය හා මූල්‍ය නොවන දිරිගැන්වීම් හඳුන්වා දී තිබීම
● සුළු ආයෝජනයකින් හා අඩු අවදානමක් සහිත ව ආරම්භ කළ හැකි ව්‍යාපාර අවස්ථා බහුල ව තිබීම (නිවැරදි කරුණකට ල. 01 බැගින් කරුණු 02 කට ල. 02 යි.)

iv. ● ආර්ථික වගකීම ● නීතිමය වගකීම ● සදාචාරාත්මක වගකීම
● පරාර්ථකාමී වගකීම (එක් කරුණකට ල. ½ බැගින් කරුණු 4 ට ල. 02 යි)

v. ● ව්‍යවසායකයන්ට සාර්ථක ප්‍රවේශයක් ලබාදීමට
● රජයක් විසින් අපේක්ෂා කරන සුහසාධන කටයුතු පවත්වාගෙන යාමට
● ව්‍යාපාර ආරම්භ කරගන්නන් තුළ ආත්ම විශ්වාසය හා යහපත් ආකල්ප ඇති කිරීමට
● ව්‍යවසායකයන්ට නව ව්‍යාපාර ආරම්භ කිරීමට උනන්දුවක් ඇති කිරිමට
(එක් කරුණකට ල. 01 බැගින් කරුණු 02 කට ල. 02 යි)

07. i. අලෙවි සැලැස්ම
★ වෙළඳපල විශ්ලේෂණය ★ යෝජිත ව්‍යාපාරයේ අලෙවිකරණ උපායමාර්ග
★ විකුණුම් පුරෝකථනය ★ විකුණුම් ආදායම් හා අලෙවි වියදම්
★ අලෙවි ස්ථාවර වත්කම් (එක් කරුණකට ල. 1/2 බැගින් ල. 01 යි)

**නිෂ්පාදන සැලැස්ම**
● නිෂ්පාදන ක්‍රියාවලිය ● නිස්පාදන ස්ථාවර වත්කම්
● නිෂ්පාදන පිරිවැය ● ඒකක පිරිවැය
(කරුණු එකකට ල. 1/2 බැගින් ල. 01)

ii. යෙදවුම් ⟶ ක්‍රියාවලිය ⟶ නිවමුම
(නිවැරදිව තොරතුරු ලියා ඇත්නම් ල. 02යි)

iii. ගැළපෙන පිළිතුරු සඳහා ල. ලබා දෙන්න.
(එක් කරුණකට 1/2 බැගින් ල. 02 යි)

iv. (අ) විමුක්තිගේ ව්‍යාපාරයේ
නිෂ්පාදන සැලැස්ම

| අයිතමය | රුපියල් |
|---|---|
| රෙදි | 15 000 |
| නූල් | 5 000 |
| බොත්තම් | 2 500 |
| අනෙකුත් අමුද්‍රව්‍ය | 500 |
| ශ්‍රමික වැටුප් | 1 200 |
| වෙනත් වියදම් | 800 |
| | 25 000 |

මුළු නිෂ්පාදන පිරිවැය රු. 25 000/= (නිවැරදි පිළිතුර පමණක් ඇත්නම් ල. 02 යි) නැත්නම් අයිතමයකට ල. 1/2 බැගින්)

(ආ) ඒකකයක නිෂ්පාදන පිරිවැය $= \frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{ඒකක ගණන}}$ (ල. 01යි)

$= \frac{25\ 000}{50}$ = 500/= (ල. 01)